# පුරප්පාඩු

## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

**(2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ව්‍යවස්ථාපිත)**

## ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 02/2016 අනුව වැටුප් ගෙවනු ලැබේ.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

01. සමාජයීය විද්‍යාව, ජනමාධ්‍ය හෝ නීතිය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂවේදී උපාධියක්

**සමග**

අදාල ක්ෂේත්‍රයේ පර්යේෂණයන්ට අදාල වූ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

**සහ**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර අටක (08) ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.

02. සමාජයීය විද්‍යාව, ජනමාධ්‍ය හෝ නීතිය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂවේදී උපාධියක් සමග අදාල ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් (PhD)

**සහ**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහ (05) ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2 හෝ 3)**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය, ජනමාධ්‍ය හෝ සමාජයීය විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ විශේෂවේදී / සාමාන්‍ය උපාධියක්

**සමඟ**

නීතිය, ජනමාධ්‍ය හෝ සමාජයීය විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

**සහ**

"අධ්‍යයන/පර්යේෂණ" සේවා ගණයෙහි (AR 1) තනතුරක අවම වශයෙන් වසර අට (08) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

03. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය, ජනමාධ්‍ය හෝ සමාජයීය විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ විශේෂවේදී / සාමාන්‍ය උපාධියක්

**සමග**

අදාල ක්ෂේත්‍රයකින් නීතිය, ජනමාධ්‍ය හෝ සමාජයීය විද්‍යා ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් (PhD) ලබා තිබීම

**සහ**

"අධ්‍යයන/ පර්යේෂණ" සේවා (AR1) ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අවුරුදු 30 නො අඩු හා 55 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

**වැටුප් ක්‍රමය :** AR 2 - 2016 රු.(76,200 - 10 X 2,000 - 96,200)

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

| | | |
|---|---|---|
| 01. | අධ්‍යාපන සුදුසුකම් (මූලික සුදුසුකම් වලට අතිරේකව) | ලකුණු 30 |
| 02. | පර්යේෂණ පළපුරුද්ද | ලකුණු 10 |
| 03. | ප්‍රකාශන, පේටන්ට් බලපත්‍ර සහ ප්‍රදානයන් | ලකුණු 20 |
| 04. | විෂය බාහිර ක්‍රියාකාරකම් | ලකුණු 10 |
| 05. | පෞරුෂය | ලකුණු 15 |
| 06. | අදාල ක්ෂේත්‍ර පිළිබඳ සාමාන්‍ය දැනුම | ලකුණු 15 |
| | මුළු ලකුණු | ලකුණු 100 |

අයදුම්රුවන්, තමන් පිළිබඳ තොරතුරු විමසිය හැකි වගකිවයුතු පුද්ගලයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක සහිතව සිය අධ්‍යාපන හා වෘත්තීය අත්දැකීම් පිළිබඳ විස්තර ප්‍රකාශයක් (CV) 2025.02.24 දින හෝ එයට ප්‍රථම පහත දැක්වෙන ලිපිනයට එවිය යුතුය.

සභාපති, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව, කාමර අංක 203-204, ගොඩනැගිලි අංක 02, බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය, කොළඹ 07.

තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

කොමිෂන් සභාවේ නියමය පරිදි

**අධ්‍යක්ෂ ජනරාල්**
**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව.**